



## අපේ ප්‍රධාන ආහාරය

අග්නි දිග ආසියා රටවල සාමාන්‍ය වී අස්වැන්න හා සසඳා බලන කල ලංකාවේ සාමාන්‍ය අස්වනු ප්‍රමාණය ඉතා සතුටුදායක යැ,යි කිය හැකිය. එහෙත් දැන් ලැබෙන අස්වැන්නට බෙහෙවින් වැඩි අස්වැන්නක් අපේ කුඹුරු වලින් පහසුවෙන්ම ලබා ගත හැකි බව නො රහසකි. මෙරට අවුරුද්දක් තුළදී යල මහ මෝසම් දෙකේදීම වගා වෙන කුඹුරු ප්‍රමාණය අක්කර 13,00,000 පමණ වෙයි. අක්කරයකින් ලැබෙන සාමාන්‍ය වී ප්‍රමාණය බුසල් 32ක් පමණ වෙතැ'යි ගණන් බලා තිබේ.

වී අස්වැන්න වැඩි කර ගැනීම සඳහා මෑතක සිට ජනප්‍රිය වී ඇති ඉතාම ඵලදායි ක්‍රමය හැටියට ගැණෙන ජපන් ක්‍රමයේ විශිෂ්ට ලක්‍ෂණ කීපයක් මෙහි ගෙන හැර දක්වමු. පර්යේෂණසථාවලින් නිර්දේශ කරනු ලබන උසස් ආරවල නුමුහුන් බිත්තර වී පාවිච්චිය, නියමිත පැළෑටි ආහාර (පෝර වර්ග) නියමිත කාල සීමාවේදී වගාවට යෙදීම, පේළිවල පැළ සිටුවීමෙන් හෝ පේළිවල වැපිරීමෙන් හෝ වල් පැළෑටි මර්දනය පහසුවෙනුත් සාර්ථක ලෙසත් කර ගැනීම, රෝග හා කෘමි උවදුරු වළක්වාලීම සඳහා දැඩි උනන්දුවක් දැක්වීම මෙකී ජපන් ක්‍රමයේ ගුණාංග වලින් සමහරකි.

තෝරාගත් නුමුහුන් වී වර්ග වැඩි අස්වැන්නක් දෙන අතර, සාමාන්‍යයෙන් ගොයමට සිදුවන නොයෙක් උවදුරු වලට ඔරොත්තු දීමටද ඒවා සමත් වෙයි. තවද වැඩියෙන් යොදන පෝර උරාගැනීමේ හා ඒවා පැලයේ හා කරලේ වර්ධනයට යොදා ගැනීමේ හැකියාවක් තෝරාගත් නුමුහුන් වී වර්ග වල අන්තර්ගතවී ඇත. එමනිසා ජපන් ක්‍රමය වැනි දියුණු ගොවිතැන් ක්‍රම උපයෝගී කර ගැනීමේදී උසස් නුමුහුන් වී වර්ග පාවිච්චිය අවශ්‍ය වන්නේමය.

1956 අවුරුද්දේ කුඹුරු අක්කර 2,50,000 ක පමණ උසස් නුමුහුන් වී වර්ග වගා කළ බව වාර්තාවී ඇත. මෙය දිවයිනේ මුළු කුඹුරු

ප්‍රමාණයෙන් සියයට 18ක් පමණි. දියුණු ගොවිතැන් ක්‍රම හා උසස් වගී පාවිච්චියෙන් ඉතා අධික අස්වනු ලබා ගන්නාවූ ජපන් රටේ සම්පූර්ණ කුඹුරු ප්‍රමාණයෙන් සියයට 80කට වැඩි තරමක උසස් නුමුහුන් වී වගී වගාකරනු ලැබේ. තෝරාගත් නුමුහුන් වගී වගා කිරීමේ ප්‍රයෝජන වටහාගත් ඉන්දියාව, විශාල කුඹුරු ප්‍රමාණයක් තිබියදීත්, මුළු ප්‍රමාණයෙන් සියයට 50 ක්ම එම වගී වගා කිරීම සඳහා යොදා ඇත. අප රටේ නුමුහුන් වී වගී වැඩි යෙන් වගා කිරීමේ ආවශ්‍යතාවය ඉහත සඳහන් නිදසුන් වලින් මොනවට පැහැදිලි වේ.

දැනට ගොවිකම් දෙපාර්තමේන්තුව මඟින් උසස් නුමුහුන් වී වගී නිපදවීමේ හා බෙදා හැරීමේ විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යොදා ඇත. මෙය තුන් අවුරුදු ක්‍රමයකි. සෑම දිස්ත්‍රික්කයකම ගොවීන් හට අවුරුදු තුනකට වතාවක් එම දිස්ත්‍රික්කයට නියමිත නුමුහුන් වගීයේ අලුත් බිත්තර වී සපයා දීම මේ ක්‍රමයේ පරමාර්ථයයි. දිස්ත්‍රික්කයක මුළු කුඹුරු ප්‍රමාණය තුන් කොටසකට සමව බෙදා, පළමු අවුරුද්දේදී එක් කොටසකට සෑහෙන තරම් බිත්තර වී සපයනු ලැබේ. දෙවන වසරේ දී තවත් කොටසකටත් තෙවැනි වසරේදී ඉතිරි කොටසටත් බිත්තර වී සපයනු ලැබේ. සිව්වැනි වසරේදී පළමු කොටසට නැවතවරක් අළුත් බිත්තර වී සැපයීම සිදුවේ. මෙයාකාර යෙන් සම්පූර්ණ කුඹුරු ප්‍රමාණය නුමුහුන් වී වලින් පිරී යනු ඇත. මේ අනුව මුළු දිවයිනෝ මාස් කන්නට බිත්තර වී බුසල් 2,70,000ක් හා යල්කන්නට බුසල් 1,70,000ක් පමණ වුවමනා කෙරේ. මෙතරම් වී ප්‍රමාණයක් රජයේ ගොවිපල්වල බෝකර ගැනීමට ඉඩකඩ නොමැති බැවින්, රජය මඟින් ගොවීන්ගේ සහාය ඇතිව, බිත්තර වී බෝකර ගැනීමේ පෞද්ගලික ගොවිපල් සෑම පළාතකම පාහේ ගොවීන්ගේ කුඹුරුවල පිහිටුවා ඇත. මේ පෞද්ගලික ගොවිපල්හී කටයුතු භාර ගොවීන් රජය මඟින් තෝරාගත් අයවලුන් විය යුතුයි.

පළාතකට නියමිත බිත්තර වී වගීයේ අත්තිකාරම් වී කිසියම් ප්‍රමාණයක් ගොවිකම් පර්යේෂණ නිලධාරීන් විසින් කන්නක් පසා නොකඩවා නිපදවනු ලැබේ. එම වීයේ පාරිශුද්ධ තාවය සියයට සියයක්ම විය යුතුයි. මේ නුමුහුන් විය මිශ්‍ර වීමට හෝ රෝගවලට ගොදුරුවීමට හෝ ඉඩ නොහැර රජයේ ගොවිපලක ඉතා පරීක්ෂාකාරීව පළමුවරට බෝකර ගනු ලැබේ. මෙලෙස බෝකර ගත් නුමුහුන් වී වැඩිමනත් බෝකර ගැනීම සඳහා ඉහත සඳහන් කළ පෞද්ගලික ගොවිපල් වලට නිකුත් කරනවා ඇත.

බිත්තර වී බෝකර ගැනීමේ පෞද්ගලික ගොවිපල් එක්යායක පිහිටි තරමට ඒවායේ පාලනය පහසු වනවාත් සමගම බලා පොරොත්තු වන පරිදි බිත්තර වී පිරිසිදු ලෙස ලබාගැනීමටද හැකිවෙයි. යම් පළාතක කුඹුරු ප්‍රමාණයෙන් තුනෙන් එක් කොටසකට අවශ්‍ය බිත්තර වී නිපදවීමට තරම්වූ කුඹුරු යායක් හෝ එවැනි යායවල් කිහිපයක් බිත්තර වී බෝකර ගැනීමේ පෞද්ගලික ගොවිපල් ලෙස වෙන් කරගත යුතුයි. මෙකී ගොවිපලක ප්‍රමාණය අක්කර 10කට වැඩි විය යුතු අතර සාර්ථක අන්දමින් වී ගොවිතැන කිරීමට අවශ්‍ය ජලය හා වෙනත් පහසුකම් එහි තිබිය යුතුය. පෞද්ගලික ගොවිපල් භාර ගොවීන් ලියා පදිංචි කරනු ලැබේ. එම ගොවීන් හට තමන්ගේ කුඹුරුවල බෝකර ගැනීමට නියමිත නුමුහුන් වී වගීයේ බිත්තර වී රජයෙන් සපයා දෙන අතර පෝර යෙදීම, වල් පැළෑටි නෙලීම, කෘමි හා රෝග බීජ නාශක බෙහෙත් ඉසීම, වැඩෙන වගාව පරීක්ෂාකොට මිශ්‍ර ගොයම් පැල ඉවත් කිරීම යනාදී දියුණු ගොවිතැන් ක්‍රම පිළිබඳව උපදෙස් හා උපකාරද දෙනු ලැබේ. මේ පෞද්ගලික ගොවිපලක දියුණු ගොවිතැන් ක්‍රම අවශ්‍ය යෙන්ම පිළිපැදිය යුතු බැවින් එයින් ආදර්ශීමත් ගොවිපලක සේවයද ඉටුවේ.

වී බෝකර ගැනීමේ පෞද්ගලික ගොවිපල් වලින් නිකුත් වන බිත්තර විය පැළවීමේ ශක්තියෙන් හා පිරිසිදු හා නීරෝගී භාවයෙන් දෙපාර්තමේන්තුවෙන් සම්මත අවශ්‍යතාවය නට ගැලපේ නම් නිලධාරීන් විසින් එය සහතික කරණු ලැබේ. එලෙස සහතික කරන ලද බිත්තර වී මිල දී ගැනීමට හෝ වෙනත් වී සමග මාරුකර ගැනීමට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් විධි විධාන

යොදනු ලැබේ. සහතික කරන ලද සෑම බිත්තර වී බුසලකට රුපියල් 2කක අතිරේ ත්‍යාග මුදලක්ද දෙනු ලැබේ.

## පළාත්වලට නිර්දෙශිත නුමුහුන් වී වගී

දිස්ත්‍රික්කයක් තුළ පසෙහි හා දේශගුණ යෙහි ඇති වෙනස් සවභාවයන් නිසාත් විවිධ ගොවිතැන් ක්‍රම නිසාත් එම දිස්ත්‍රික්කයේ සෑම ස්ථානයකටම යෝග්‍ය වගී නිර්දේශ කිරීම අපහසු කරුණකි. එහෙත් මෙහි සඳහන් ව ඇත්තේ සාමාන්‍යයෙන් දිස්ත්‍රික්කයක වැඩිම පෙදෙසකට සුදුසු වගීයන්‍ය. මේ නුමුහුන් වී වගී විවිධ පළාත් වලට නිර්දේශ කරනු ලබන්නේ මෙතෙක් රජයේ ගොවිපල්වල කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල සලකා බැලීමෙන් පසුවය. එහෙත් දනට දිවයිනේ සෑම පළාතකම වාගේ පවත්වාගෙන යනු ලබන පර්යේෂණ වලින් අළුත් වගී ලබා ගැනීමට බලාපොරොත්තු වන නිසා පහත සඳහන් ලේඛනය විටින් විට සංශෝධනය කළ යුතුව තිබේ.

එක් එක් පළාතට යොග්‍යයැ'යි අනුමතකර තිබෙන නුමුහුන් වර්ග පහත සඳහන් වේ:—

| දිස්ත්‍රික්කය | මාස් කන්න | යල් කන්න |
|---|---|---|
| ගාල්ල | එච්—501 | දෙවරැද්දිරි—26081 |
| | මුරුංගාකායන් 302 | එච්—501 |
| | | මුරුංගාකායන් 302 |

දෙවරැද්දිරි 26081 ජල ගැලීම් වලට භාජන වියහැකි කුඹුරු වලට පමණක් සුදුසුය.

| දිස්ත්‍රික්කය | මාස් කන්න | යල් කන්න |
|---|---|---|
| මාතර | මුරුංගාකායන් 302 | මුරුංගාකායන් 302 |
| | එච්—501 | එච්—501 |
| | පොඩි වී (ඒ—8) | හීනටි. 1සී. පී. වයි—15 |

පොඩි වී (ඒ—8) නිර්දේශ කර ඇත්තේ යලට වැඩ නොවන ගහබඩ, කඳබඩ පත්තුවට හා වැලිගම් කෝරළයට අයත් අක්කර 2,000 ක පමණ කුඹුරු ප්‍රමාණයකටය.

| දිස්ත්‍රික්කය | මාස් කන්න | යල් කන්න |
|---|---|---|
| හම්බන්තොට | එච්—102 | එච්—102 |
| | එච්—105 | එච්—105 |
| | මුරුංගාකායන් 104 | මුරුංගාකායන් 104 |
| | පොක්කාලි | පොක්කාලි |
| | පී. ටී. බී—16 | |

පොක්කාලි—කරදිය ඇති තැන් වලට.

එච්—102—බස්නාහිර හා නැගෙනහිර ගිරුව පත්තුවට.

එච්. 105 සහ මුරුංගාකායන් 104—මාගම් පත්තුවට.

පී. ටී. බී—16.—සැප්තැම්බර් මස අන්තිම සිට ගංවතුරට යටවෙන ගිරුව පත්තුවේ කිරම ඔය දෙපස ඇති අක්කර 2,500 ක් පමණ බිම් පෙදෙසට

| දිස්ත්‍රික්කය | මාස් කන්න | යල් කන්න |
|---|---|---|
| බදුල්ල | මුරුංගාකායන් 302 | පච්චපෙරුමාල් 2462/11 |

මුරුංගකායන් 302.—උඩුකිඳ පළාතේ යලමහ දෙකට තාවකාලික වශයෙන් නිර්දේශ කර ඇති වර්ගයකි.

| දිස්ත්‍රික්කය | මාස් කන්න | යල් කන්න |
|---|---|---|
| කෑගල්ල ... | ... පොඩි වී (ඒ—8) ... | ... මුරුංගාකායන් 302 |
| | පී. ටී. බී—16 ... | ... පච්චපෙරුමාල් 2462/11 |
| | මුරුංගාකායන් 302 | |
| රත්නපුරය ... | ... පොඩි වී (ඒ—8) ... | ... මුරුංගාකායන් 302 |
| | පී. ටී. බී—16 ... | ... කළු හීනටි 3254 |
| | සියම්—29 | |
| | මුරුංගාකායන් 302 | |

**කළු හීනටි 3254.**—වගුරු බිම් වලට යෝග්‍ය වෙයි.

**මුරුංගාකායන් 302.**—කඩවත හා මැද කෝරළවලට යෝග්‍ය වෙයි. කොළොන්න හා අටකලන් කෝරළවල පමාවී වැපිරීමට මේ වර්ගය සුදුසුය.

| | | |
|---|---|---|
| කොළඹ ... | ... පොඩි වී (ඒ—8) ... | ... දෙවරැද්දිරි—26081 |
| | පී. ටී. බී—16 ... | ... මුරුංගාකායන් 302 |
| | මුරුංගාකායන් 302 ... | ... පොක්කාලි |

**පොඩිවී (ඒ—8), පී. ටී. බී—16 සහ මුරුංගාකායන් 302.**—කැළණි ගඟින් උතුර කොටසට සුදුසුය. කැළණි ගඟින් දකුණු කොටසට මාස් කන්නේදී වගා කිරීමට යෝග්‍ය වන්නේ මුරුංගාකායන් 302 පමණි. හේවාගම් කෝරළයට මුරුංගාකායන් 302 යල් කන්නට නිර්දේශකර ඇත්තේ පර්යේෂණ වලින් දියුණු ආරයන් ලැබෙන තෙක් පමණි. දෙවරැද්දිරි 26081 ජල ගැලීම්වලට භාජන වෙන කුඹුරු වලටත් පොක්කාලි කරදිය ඇති තැන්වලටත් සුදුසුය.

| | | |
|---|---|---|
| කළුතර ... | ... මුරුංගාකායන් 302 ... | ... දෙවරැද්දිරි 26081 |
| | හොඩරවාල 502 ... | ... මුරුංගාකායන් 302 |
| | පී. ටී. බී—16 | |

හොඩරවාල 502.—අඩු වයස් වර්ගයක් වූ නමුත් එම වර්ගයේ පීදීම කෙරෙහි දවල් කාලයේ දීර්ඝත්වය බලපාන හෙයින් ඔක්තෝබර් 15 වැනිදට පෙර වැපිරිය යුතුයි.

පී. ටී. බී—16.—නිර්දේශ කරනු ලබන්නේ කළුතර තොටමුනේ හා රයිගම් කෝරළයේ අක්කර 2,000 ක පමණ කුඹුරු ප්‍රමාණයකටය. මෙහි මැයි සහ ජූනි මාසවලදී ඇතිවෙන ජලගැලීම් නිසා යල් කන්නට කුඹුරු වගාකිරීම අපහසු වෙයි.

යල් කන්නට සුදුසු වර්ග සොයා ගන්නා තෙක් මෙහි නම්කර ඇති වර්ග තාවකාලික ලෙස නිර්දේශ කරනු ලැබේ.

**දෙවරැද්දිරි 26081.**—ජල ගැලීම් වලට භාජන විය හැකි කුඹුරුවලට පමණක් යෝග්‍ය වේ.

| දිස්ත්‍රික්කය | මාස් කන්න | යල් කන්න |
|---|---|---|
| මහනුවර ... | ... පොඩි වී ( (ඒ—8) ... | ... මුරුංගාකායන් 302 |
| | මාවී (බී—11) ... | ... හීනටි 1 සී. පී. වයි—15 |
| | පී. ටී. බී—16 | |
| | මුරුංගාකායන් 302 | |

උඩ පලාත හා උඩ බුලත්ගම යන පලාත් වලට මාවී (බී—11) සහ පී. ටී. බී—16 මාස් කන්නේදී වගා කිරීම පිණිස යෝග්‍ය වේ.

| | | |
|---|---|---|
| මාතලේ ... | ... මාවී (බී—11) ... | ... මුරුංගාකායන් 302 |
| | පී. ටී. බී—16 ... | ... හීනටි 1. සී. පී. වයි—15 |
| | මුරුංගාකායන් 302 ... | ... පච්චපෙරුමාල් 2462/11 |

දකුණු හා නැගෙනහිර මාතලේ මාස් කන්නේදී වගාකළ යුත්තේ මාවී (බී—11), පී. ටී. බී—16 සහ මුරුංගාකායන් 302 යන වර්ගයන්ය. මාස් කන්නේදී උතුරු මාතලයට යෝග්‍ය මුරුංගාකායන් 302 පමණි.

දකුණු හා නැගෙනහිර මාතලේ යල් කන්නේදී වගා කළ යුත්තේ මුරුංගාකායන් 302 හා හීනටි 1 සී. පී. වයි.—15 යන වර්ගයන්ය. පච්චපෙරුමාල් 2462/11 සහ මුරුංගාකායන් 302 උතුරුමාතලේ යල් කන්නට සුදුසුය.

| | | |
|---|---|---|
| නුවරඑළිය ... | ... මාවී (බී—11) ... | ... මුරුංගාකායන් 302 |
| | පී. ටී. බී—16 | |
| | මුරුංගාකායන් 302 | |

කොත්මලේ මාස් කන්නට මාවී (බී—11) සහ පී. ටී. බී—16 යෝග්‍යවේ. උඩ-හේවාහැට සහ වලපනේට මාස්කන්නේදී සුදුසු වර්ග මාවී (බී—11), පී. ටී. බී—16 සහ මුරුංගාකායන් 302 යන වර්ගයන්ය.

නුවරඑළි දිස්ත්‍රික්කයට අළුත් වර්ග සොයා ගන්නා තෙක් මෙහි නම්කර ඇති වර්ග තාවකාලික ලෙස නියමිතව ඇති බව සලකන්න.

| | | |
|---|---|---|
| අනුරාධපුරය ... | ... මුරුංගාකායන් 302 ... | ... පච්චපෙරුමාල් 2462/11 |
| | හාල් සුදුවී 312 ... | ... හීනටි 310 |

හාල් සුදුවී 312 මාස් කන්නේදී පමාවී වැපිරීමට සුදුසුය.

| | | |
|---|---|---|
| පොළොන්නරුව | ... මුරුංගාකායන් 302 ... | ... පච්චපෙරුමාල් 2462/11 |
| | | හීනටි 310 |
| පුත්ත ලම/හලාවත | ... පොඩි වී (ඒ—8) .. | ... පච්චපෙරුමාල් 2462/11 |
| | මුරුංගාකායන් 3 ... | ... වන්නි දහනල 1 |
| | පී. ටී. බී—16 | |

| දිස්ත්‍රික්කය | මාස් කන්න | යල් කන්න |
|---|---|---|
| | දකුණු හා උතුරු පිටිගල් කෝරළයට පොඩි වී (ඒ—8) සහ පී. ටී. බී—16 පමණක් මාස් කන්නට සුදුසු වර්ගයන්ය. | |
| කුරුණෑගල ... | ... මුරුංගාකායන් 3 ... | ... පච්චපෙරුමාල් 2462/11 |
| | පී. ටී. බී—16 ... | ... මුරුංගාකායන් 3 |
| | පොඩි වී (ඒ—8) ... | ... වන්නි දහනල 1 |
| | මාස් කන්නේදී වන්නි හත්පත්තුවට මුරුංගාකායන් 3 හා කටුගම්පොල හත්පත්තුවට පොඩි වී (ඒ—8) යෝග්‍යවේ. | |
| ත්‍රිකුණාමලය ... | ... මුරුංගාකායන් 302 ... | ... පච්චපෙරුමාල් 2462/11 |
| මඩකලපුව ... | ... මුරුංගාකායන් 302 ... | ... වෙල්ලෙයි පෙරුනල් 28724 |
| | උවර්වෙල්ලෙයි ... | ... පච්චපෙරුමාල් 2462/11 |
| | උවර්වෙල්ලෙයි කරදිය ඇති කුඹුරුවලට සුදුසුය. | |
| යාපනය ... | ... පෙරිය වෙල්ලෙයි 538... | ... පච්චපෙරුමාල් 2462/11 |
| | මුරුංගාකායන් 302 ... | ... මුරුංගා 308 |
| | ඇස්. ආර්. 26 | |
| | ඇස්. ආර්. 26.—කරදිය ඇති කුඹුරුවලට සුදුසුය. | |
| මන්නාරම ... | ... මුරුංගාකායන් ... | ... පච්චපෙරුමාල් 2462/11 |
| | | මුරුංගා 308 |
| වවුනියා ... | ... මුරුංගාකායන් 302 ... | ... පච්චපෙරුමාල් 2462/11 |

*  *  *  *  *  *

හොඳ හැටි පුරුදු හින්දු අත උදල්ල ට
වැපුරූ කුඹුර සරු සාරයි පෙනිල්ල ට
දරුවෙකු වගේ නැඟ පැද්දෙන තොටිල්ල ට
ගොයමත් වැනේ අසුවී නල කැරල්ල ට

පි. සු. විජේසේකර,
රූපහ.